**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගිණුම්කරණ ප්‍රමිත 16 දේපළ පිරියත හා උපකරණ | | |
| (i) කොමිෂන් සභාවේ දේපළ පිරියත හා උපකරණවල පිරිවැය වටිනාකම, රු.13,272,142,850 කට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.<br>කොමිෂන් සභාවට අයත් ලෙස දක්වා තිබූ රු.45,000,000 ක් වටිනා අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකමට ඉදිරි වසරේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන තිබියදී ඒ ගැන නොසලකා ඉඩමේ මුළු පිරිවැය ඉහත වටිනාකම තුළ අන්තර්ගත කර තිබුණි. | | |
| (ii) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.15,192,644 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රමිතියේ 51 ඡේදය ප්‍රකාරව එම වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරන වටිනාකමට ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) ගිණුම්කරණ ප්‍රමිත 37 වෙන්කිරීම් අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වගකීම් | | |
| ආයතන 03 ක් විසින් පිළිවෙලින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත එකතුව රු.62,146,612,000 ක වන්දි ඉල්ලා කොමිෂන් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. සේවා කඩකිරීම් හා සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයකට හානි වීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එරෙහිව පනවා තිබූ නඩුව සම්බන්ධයෙන් රු.14,800,000,000 ක වන්දි මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මෙම නඩුව සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල සටහන්කර ඇති නමුත් ඊට අදාල වන්දි මුදලේ ඇස්තමේන්තු ගත වටිනාකම වන රු.මිලියන 14,800 සටහන් කිරීමට නොහැකි වී ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ප්‍රකාරව ඇස්තමේන්තුගත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා අයකර ගන්නා ලද ප්‍රමාද ගාස්තු මුදල වූ රු.1,680,544,180 වෙනත් ආදායම් ලෙස ගණනය කළ යුතු | ව්‍යාපෘති උපදේශකවරුන් වන මොරටුව විශ්ව විද්‍යාලය මගින් දී ඇති රෙකමදෝරුවට අනුකූලව ඉදිරියේදී ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමක් (BOT) සඳහා වූ | ප්‍රමාද ගාස්තු ජංගම වගකීම් යටතේ ඇතුළත් කිරීම සඳහා හේතු වූ කරුණු තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| වුවත් නෙළුම් කුළුණ ප්‍රමාද ගාස්තු ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. ඊට අමතරව ඒ සඳහා විනිමය අලාභ ගණනය කර රු.226,998,520 ක මුදලක් ද එම ගිණුමට බැර කර තිබුණි. | අමාත්‍ය අනුමැතිය ලබාගැනීමට කෙටුම්පත් මුදල "Delay Damages" ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර ඇති බව. තවද වසර අවසානයේදී, විදේශ මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී එදිනට පවතින විනිමය අනුපාතය අනුව විනිමය අලාභය ගණනය කර ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 21 ට අනුකූලව ගිණුම්ගත කර ඇති බව. | |
| (ආ) 2018 ඔක්තෝබර් 24 සිට 2019 ඔක්තෝබර් 23 දක්වා වූ වර්ෂය සඳහා Oracle Database Support සේවා ගිවිසුම අළුත් කිරීම වෙනුවෙන් රු.1,924,800 ක් ගෙවා තිබූ අතර 2019 ජනවාරි 01 සිට 2019 ඔක්තෝබර් 23 යන කාලපරිච්ඡේදයට අදාල වටිනාකම ලෙස රු.1,560,934 ක් ඉදිරියට ගෙවීමක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව එම ගණනින් වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපචිත පදනම මත ගිණුම් පිළියෙල කරන බැවින් 2019 ජනවාරි සිට 2019 ඔක්තෝබර් දක්වා මාසයන්ට අදාල වියදම ඉදිරියට කළ ගෙවීම් ලෙස හඳුනාගත යුතුය. |
| (ඇ) 2018 සැප්තැම්බර් 01 සිට 2019 අගෝස්තු 31 දින දක්වා විදුලි සෝපානයේ සේවා කටයුතු ඉටුකිරීම සඳහා 2018 නොවැම්බර් 30 දින රු.560,955 ක් ගෙවා තිබුණ අතර 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු.373,458 ක් ඉදිරි ගෙවීමක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව එම ගණනින් වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2019 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා මාසයන්ට අදාල වියදම් ඉදිරියට කළ ගෙවීම් ලෙස හඳුනාගත යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විෂයය** | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.** | **වෙනස රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| (අ)ජාතිය ගොඩනැගීමේ බද්දට සහ ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් පිරිවැටුම | 11,811,272,245 | 11,845,891,066 | 34,618,821 | මෙම වෙනස හඳුනාගැනීම සඳහා සැසඳීම් ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගෙන ඇති අතර, ඉදිරි වසරවලදී මෙම සැසදුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති පිරිවැටුම් ද මුදල් පදනමට ගලපා ඇති බැවින් වෙනසට හේතු මොනවාද යන්න වාර්තා කළ යුතුය. |
| (ආ) එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය | 223,392,670 | 238,629,877 | 15,237,207 | අදාල වෙනස නිරීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විෂය** | **මුදල රු.** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර තැන්පතු | 354,000,000 | ආයෝජන සහතික පත | මෙම ආයෝජනය පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අදාල ලිපිගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | තහවුරු කිරීමට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරන ක්‍රියාකරුවන් 04 දෙනෙකුගෙන් 2012 වර්ෂයේ සිට අයවිය යුතු කල්බදු මුදල් අයකර ගැනීමට ගිවිසුම් ගත වී නොතිබුණ අතර ගිවිසුම් ගත වූ ලංකා බෙල් ආයතනයේ එක් ක්‍රියාකරුවකුගෙන් රු.334,293 ක් 2019 මැයි 15 දින දක්වාම අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම්වලට එළඹ නැති ක්‍රියාකරුවන් හතර දෙනා සමඟ ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සිදුකරගෙන යන අතර ලංකා බෙල් සමාගමට අදාල ගෙවීම් කරන ලෙස 2018.06.18 දින සිහිකැඳවීම් ලිපි යවා ඇත. | මුදල් අයකර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) | මෙම කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් 2012 ජනවාරි සිට 2018 නොවැම්බර් 30 දින දක්වා අයවිය යුතු විදුලි බිල්පත් වටිනාකමින් රු.75,463,256 ක් 2019 මැයි 15 දින දක්වා අයකර ගෙන නොතිබුණි. මෙම මුදල් නොගෙවීම සම්බන්ධව ක්‍රියාකරුවන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොමිෂන් සභාව විසින් **SLBC/SLRC** හා **ITN** යන ආයතන වෙත මෙම දීර්ඝකාලීනව පැවත එන විදුලි බිල්පත් සඳහා අය විය යුතු මුදල ගෙවා දමන ලෙස කිහිපවරක් දැනුම් දී ඇතත් ඔවුන් ඒ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. | මුදල් අයකර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.1,661,523,593 ක් වූ අතර ඒ තුළ වූ වසර 02 කට වැඩි ණය ශේෂය රු.373,504,055 ක් විය. ණයගැති වර්ගීකරණය අනුව වසර 02 කට වැඩි සියළුම ණයගැතියන් මෙම බාණ්ඩයට ඇතුළත් කර තිබූ බැවින් එම ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණය නිවැරදිව හඳුනාගත නොහැකි වූ අතර අවුරුදු 07 සිට අවුරුදු 30 කට අධික කාලයක සිට පැවතෙන ආයතන 10 ක රු. මිලියන 1 ට වැඩි එකතුව රු.302,858,443 ක ශේෂයක්ද මෙම ශේෂය තුළ පෙන්වා තිබුණි. | වසර 02 ට වැඩි සියළුම ණයගැතියන් නිශ්චිත වයස් කාණ්ඩ අනුව වර්ගීකරණය කර ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණය නිවැරදිව හඳුනාගත හැකි වන පරිදි පෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව. | ණයගැතියන් නිශ්චිත වයස් බාණ්ඩ අනුව වර්ගීකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව හා අය නොවී පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 වනවිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අයවිය යුතු මුදල රු.145,254,449 ක් වූ අතර ඒ තුළ 1981 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් ද විය. | මෙය අයකර ගැනීම සඳහා කොමිෂන් සභා තීරණයක් පරිදි ජනමාධ්‍ය ලේකම්තුමාගේ ඉක්මන් මැදිහත් වීම ඉල්ලා අතිගරු ජනාධිපතිතුමාට පිටපත් සහිතව ලිපි යවා ඇත. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ණයගැතියන්ගෙන් වැඩියෙන් අයකර ගෙන තිබුණු සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු මුදල වූ රු.2,129,435 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් වැඩිදුරටත් විශ්ලේෂණය කර, ඊට අදාල ගත හැකි ක්‍රියාමාර්ග කොමිෂන් සභාවේ තීරණයට යටත්ව ගැනීමට කටයුතු කරන බව. | වැඩියෙන් අයකර ගන්නා ලද මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතට අනුව විදුලි සංදේශ බදු ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙවිය යුතු වුවද ආයතන 03 ක් විසින් නියමිත පරිදි බදු මුදල් හා අධිභාර ගෙවා නොතිබුණෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී එක් ආයතනයකින් රු.6,358,657 ක් හා තවත් එක් ආයතනයකින් රු.1,267,758 ක් පමණක් අයවිය යුතු ලෙස ගණනය කළ හැකිව තිබුණි. | **LCSN** ආයතනයෙන් බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු කරමින් සිටින බවත් අනෙකුත් ආයතන වෙතින් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | විදුලි සංදේශ බදු පනතට අනුව නියමිත පරිදි බදු හා අධිභාර අයකර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අරමුදලින් රු.7,404,781 ක් පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද ගෙවා තිබුණි. | උපයන විට බදු ගෙවීම අදාල නිලධාරීන්ගෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම සිදුවේ. නමුත්මෙම නිලධාරීන්ගෙන් අඩුකරනු ලබන එම උපයන විට ගෙවන බදු නැවතත් කොමිෂන් සභාව විසින් නිලධාරීන්ට ප්‍රතිපූර්ණය කිරීමක් සිදුවේ. මෙසේ උපයන විට ගෙවීම් සේවකයන්ගෙන් අඩුකිරීම ප්‍රතිපූර්ණය කිරීමේ නීතිමය තත්ත්වය නීතිපති | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවලට අනුව උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුවෙන් විමසන ලදී. එහිදී උපයන විට ගෙවීම් බදු සේවකයන්ට නැවත ප්‍රතිපූර්ණය කිරීමේ නීතිමය බාධාවක් නොමැති බව දන්වා එවන ලදී. ඒ අනුව එම පිළිතුර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා මේ වන විටත් ඉදිරිපත් කර ඇති බව. | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම සිදුකර 2019 වසරේදී විධිමත්ව අවසන් කළ පසු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගැනීමට කටයුතු කරන බව. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය ප්‍රකාර භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 757 (2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නැත. | මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාර භාණ්ඩ සමීක්ෂණයක් නිසි පරිදි සිදුකර අදාල වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා තීරණය කිරීමේදී, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද එම නිර්දේශ හා අනුමැතිය නොමැතිව කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා | වැටුප් හා දීමනා තීරණය කිරීමට කොමිෂන් සභාව වෙත 1996 අංක 22 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් බලතල පැවරී ඇති අතර නීතිපතිතුමා විසින් අංක E/164/07/TRC හා 2007.08.15 සහ E/164/07/TRC හා 2007.09.24 දිනැති ලිපි මගින් උපදෙස් ලබා දී ඇති බව. | දීමනා සහ වැටුප් ගෙවීමේදී වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | හා ගෙවල් කුලී දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.91,859,110 ක් ගෙවා තිබුණි. | | |
| (ඉ) | 2007 ජුනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා රු.2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවිය යුතුව තිබුණද රු.6,000 බැගින් සමාලෝචිත වර්ෂයේ රු.11,808,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.7,872,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මෙම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවා ඇති දීමනා, ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 22C(2) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව කොමිෂන් සභාවේ අනුමැතිය මත ගෙවා ඇත. එසේම නීතිපතිතුමාගේ E/164/07/TRC හා 2007.08.15 සහ E/164/07/TRC හා 2007.09.24 දිනැති ලිපි මගින් ද තවදුරටත් ඒ පිළිබඳව එකඟතාවය පලකර ඇත. | නිර්දේශ කරන ලද දීමනාව පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.45,706,552,824 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.53,576,471,208 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,869,918,384 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම (Levy on outgoing local access charges) රු.6,335,108,677 කින් අඩුවී තිබීම සහ ස්මාර්ට් ෆෝන් (Smart Phone) භාවිතය හා ඕවර් ද ටොප් (Over – the – top) නොමිලේ භාවිතා කළ හැකි මොබයිල් ඇප්ලිකේෂන් භාවිතය සහ රජයේ බදු ප්‍රතිපත්තියේ වූ වෙනස්වීම් ද මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඊට අමතරව රුපියලේ අගය ඉතා වේගයෙන් අවප්‍රමාණය වීම නිසා විදේශ විනිමය ගණුදෙනුවලින් වූ පාඩුව පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 1,545 කින් ඉහළ යාම හා ප්‍රසාද දීමනා වියදම සියයට 50 කින් ඉහළයාම ද මේ සඳහා හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයන් නොවන චිත්‍රපටයක් හා ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.32,192,177 ක් හා රු.7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අතර චිත්‍රපටය වෙනුවෙන් වැයකරන ලද මුදලින් රු.26,400,000 ක් පමණක් චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් 2018 ජනවාරි 12 දින වන විට ආපසු ගෙවා තිබුණි. තවදුරටත් රු.5,782,177 ක මුදලක් අයකර ගැනීමට ඉතිරිව තිබුණෙන් චිත්‍රපටි නිෂ්පාදනයෙන් අයකරගත නොහැකි වූ සහ ටෙලි නාට්‍ය වෙනුවෙන් ගෙවූ එකතුව රු.12,952,577 ක මුදල ආර්ථික නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාව විසින්, මෙම වැයකරන ලද මුදල පියවීම සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තීරණය කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර දැනට එම කමිටුවේ නිර්දේශ අනුව කටයුතු කරනු ඇත. | කොමිෂන් සභාවේ අරමුණුවලින් බැහැර වූ කාර්යයන් සිදු කිරීමට කොමිෂන් සභා අනුමැතියද ලබා දී ඇති බැවින් සභාවට වූ අලාභය සම්බන්ධයෙන් කොමිෂන් සභාවද වගකිව යුතු වන අතර අලාභ මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කඩිනම් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද එහෙත් ක්‍රියාත්මක නොකරන ලද “Net Safe Child Protection” වැඩසටහන සඳහා 2018 වර්ෂයේදී ද රු. මිලියන 10 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මෙම වැඩසටහන සඳහා කොමිෂන් සභා අනුමැතිය ලැබී නොතිබුණ අතර ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පෙරහණු ක්‍රම (Filtering Mechanism) මගින් අන්තර්ජාලයේ අන්තර්ගතයන් පාලනය කිරීමට ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කර තිබුණි. එසේ වුවද 2019 අප්‍රේල් 09 තෙක් එම යෝජනාවද ක්‍රියාත්මක කරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | පෙරහනු ක්‍රම (Filtering System) මගින් අන්තර්ජාලය පාලනය කිරීමට ක්‍රමවේදයක් සැකසීම, කොමිෂන් සභාව විසින් කරන ලද යෝජනාවක් පමණක් බවයි. | වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට පෙර වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීම සිදුකළ යුතු වීම හා අන්තර්ජාලය තුළින් ළමුන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හේතුවෙන් 2016 වර්ෂයේදී කල්දමා තිබූ සංඛ්‍යාත නිරීක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම යන වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළදී ද සිදුකර නොතිබුණි. | සංඛ්‍යාත නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීමට අදාල කටයුතු සිදුවෙමින් පවතී. තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගැනීම පිණිස කටයුතු කරමින් පවතී. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව හා ක්ෂේත්‍රය පිළිබඳ තාක්ෂණික දැනුමැති නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජංගම දුරකථන භාවිතා කරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා “ජාතික උපකරණ හඳුනා ගැනීමේ ලේඛනය”(National Equipment Identity Register) සකස් කිරීම සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණද ව්‍යාජ දුරකථන වෙළෙඳපොළට ඒම වැලැක්වීම සඳහා වූ වැඩසටහන 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික උපකරණ හඳුනා ගැනීමේ ලේඛනය (**Nation Equipment Identity Register** ) සකස් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2019 විදුලි සංදේශ කොමිෂන් සභාවේ අයවැය ලේඛනයට ඇතුලත් කර ඇති අතර එම කාර්යය කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු සිදුකරමින් පවතී. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් නිකුත් කළ 2010 හා 2017 මාර්ගෝපදේශයන් නීතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | දුරකථන කුළුණු මාර්ගෝපදේශයක් නීතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධ මාර්ගෝපදේශය නීතියක් බවට පත්කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිකිරීම් කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 2,494 ක් වූ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2014 අගෝස්තු 10 දින වැඩ ආරම්භ කර 2016 ජූලි මාසය වන විට ඉදිකිරීම නිම කළ යුතු විය. මෙම ව්‍යාපෘතිය 2016 ජූනි 23 දින වන විට නතර කර තිබුණ අතර 2018 දෙසැම්බර් 31 දිනට | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ අර්ධ වශයෙන් නිමකළ ගොඩනැගිල්ල සුදුසු ගෙවීම් ක්‍රමයක් මත මිලදී ගැනීමට බලාපොරොත්තු වන ආයෝජකයෙකු සෙවීමට කටයුතු කරමින් සිටී. | නිශ්කාර්යව පවතින ගොඩනැගිල්ල ආයෝජන කටයුත්තකට යෙදවීමට කඩිනමින් කටයුතු සිදු කළ යුතුය. |

මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 684 ක් වූයෙන් ඉදිකිරීම් නිම නොකරන ලද මෙම ගොඩනැගිල්ල වසර 02කට අධික කාලයක සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කලද වර්ෂය තුල ක්‍රියාත්මක නොකරන ලද රු.1,856,798,710 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 32 ක් වූ අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් අයිතමයන්ගෙන් වර්ෂය තුල ප්‍රසම්පාදන කාර්යයන් 11 ක් පමණක් අවසන් කර තිබුණි. | අළුතින් මිලදී ගැනීම අවශ්‍ය නොවන බව පසුව හඳුනා ගැනීම, සංකීර්ණ තොරතුරු තාක්ෂණ පද්ධති වීම, මුදල් අමාත්‍යාංශයේ නියමය පරිදි රථ වාහන මිලදී ගැනීම තාවකාලිකව නවතා තිබීම වැනි විවිධ හේතු නිසා ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් අයිතමයන් 21 ක් අවසන් කිරීමට නොහැකි වූ බව. | සැලැසුම් සකස් කිරීමේදී අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව සැලැසුම් සකස් කළ යුතු වීමත්, හැකිතාක් දුරට සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොකර වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රසම්පාදන 10 ක් වූ අතර එහි වටිනාකම රු.3,376,754 ක් විය. | 2018 වසරට අදාලව ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත්ව නොතිබුණු සමහර ප්‍රසම්පාදන කාර්යන් හදිසි අවශ්‍යතාවය සලකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන සැලසුමට පරිබාහිරව මිලදී ගැනීමට කටයුතු කෙරුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නෙළුම් කුළුණ ව්‍යාපෘතිය<br>2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුළුණ ඉදිකිරීමේ කොන්ත්රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර තිබුණ අතර 2012 ජනවාරි 03 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එම සමූහය, කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩො 104,300,000 ක් වූ අතර ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (අ) 2011 දෙසැම්බර් 14 දිනැති අංක අමප/11/2262/501/026/ටීබිආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව හෙක්ටයාර් 2.59 ක ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොමිෂන් සභාව වෙත පවරා දී නොතිබුණි. | මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියට සිහි කැඳවීම් කිහිපයක් නිකුත් කලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි වැය වූ පිරිවැය පමණක් අයකර ඉඩම පැවරීමට මේ වන තෙක් කටයුතු කර නොමැත. ඒ වෙනුවට නාගරික සංවර්ධන අධිකාරිය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින්නේ අමාත්‍ය මණ්ඩල තීරණයට සමගාමී නොවී අත්සන් කළ අවබෝධතා ගිවිසුමේ සඳහන් රු. බිලියන 11.7 ක් ගෙවන ලෙසයි. | ඉඩම කොමිෂන් සභාව වෙත පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ)නෙළුම් කුළුණ ඉදිකිරීමෙහි කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2015 අගෝස්තු 28 දිනැති අංක 2K15.217.02(2) දරන කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද 2019 මාර්තු 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | එකඟ වන බව. | තවදුරටත් සිදුවන ප්‍රමාදයන් වලක්වා ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)උපදේශන ගාස්තු වශයෙන් වාරික 12 ක් එනම් රු.150,000,000 ක් ගෙවීමෙන් පසු එම ගෙවීම් අත්හිටුවා උපදේශන ගාස්තු ගෙවීමේ ගිවිසුම් කොන්දේසි විධිවිධානවලට පරිබාහිරව කොන්ත්‍රාත් අධීක්ෂණය වෙනුවෙන් යැයි සඳහන් කර මසකට රු.3,000,000 බැගින් 2015 නොවැම්බර් මස සිට උපදේශක ගාස්තු වශයෙන් ගෙවමින් පවතී. එසේ ගෙවීමට සිදු වූ මූලික කාරණාව ව්‍යාපෘතියේ ඉදිකිරීමේ වැඩ මනා අධීක්ෂණයකින් තොරව සිදු කිරීමට ඉඩහැරීමෙන් සිදුවිය හැකි හානි වළක්වා ගැනීම බව කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි. | එකඟ වන බව. | ගිවිසුම් කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතු බව හා උපදේශන ගාස්තු ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ)කොළඹ නෙළුම් කුළුණ දේපළ කලමනාකරණ සමාගමකට බඳු දීම සඳහා වූ ක්‍රියාවලියක් ආරම්භ කර තිබුණ ද ඒ සඳහා මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ දේපල කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි සංදේශ පනතට අනුව සමාගම් පිහිටුවීමට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.ඒ අනුව රේඛීය අමාත්‍යාංශය සමඟ නෙළුම් කුළුණ ඉදි කිරීමෙන් පසු ක්‍රියාවලිය පිළිබඳ එකඟතාවයට පැමිණ එම ක්‍රියාවලිය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මුළු අනුමත කාර්ය මණ්ඩලය 298 ක් වුවද අනුමත නොවූ තනතුරු 02 ක් සමඟ තථ්‍ය කාර්ය මණ්ඩලය 221 ක් වූයෙන් මුළු පුරප්පාඩු සංඛ්‍යාව 79 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම හා ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීම 2019 මාර්තු වන විටත් නිමකර නොතිබුණි. එසේම අනුමත තනතුරක් නොවූ සහකාර ගණකාධිකාරීවරුන් | 2018.12.31 දිනට අනුමත කාර්යමණ්ඩලය 298 ක් හා පුරප්පාඩු 79 ක් වූ අතර සේවා අවශ්‍යතාව මත මෙම පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලි ආරම්භ කර ඇත.<br>මේ වන විට නව කාර්ය මණ්ඩල අවශ්‍යතා, සංවිධාන ව්‍යුහය, බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරමින් පවතින අතර ඒ සඳහා අනුමැතියට | අත්‍යාවශ්‍ය බඳවා ගැනීම් සිදුකිරීම හා ආයතනික ව්‍යුහය හා බඳවා ගැනීමේ රීති බාණ්ඩයෙහි සිදුකළ යුතු වෙනස්කම් කඩිනමින් සිදුකළ යුතු බව හා සහකාර ගණකාධිකාරී තනතුරු දෙක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙදෙනෙකු 2015 වර්ෂයේ සිට සේවයේ යොදවා තිබුණද මෙතෙක් එම තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත බැවින් සහකාර ගණකාධිකාරි තනතුරු 02 සඳහා ද අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | |
| (ආ) | නිත්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර ද්විතියන පදනම මත නිලධාරීන් 08 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 28 දෙනෙකු 2018 දෙසැම්බර් 31 දින වන විට බඳවා ගෙන තිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමේ ක්‍රමවේදය තීරණය කරනුයේ කොමිෂන් සභාවේ පත්කිරීම් රීති කාණ්ඩයෙන් හා කොමිෂන් සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරවය. ඒ අනුව කොන්ත්‍රාත් පදනම මත 28 දෙනෙකු හා ද්විතියන පදනම මත 08 දෙනෙකු අත්‍යවශ්‍ය තනතුරු සඳහා පත්කර ඇති බව. | ද්විතියන පදනම මත බඳවා ගන්නා නිලධාරීන්ගේ සේවය අඛණ්ඩව ලබාගැනීමට හැකියාව නොලැබෙන බැවින් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් කළ යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාවේ බඳවා ගැනීම් පරිපාටියේ දැක්වෙන පරිදි හා 2011 දෙසැම්බර් 11 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇති අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරීන් සංඛ්‍යාව 04 ක් වුවද කොමිෂන් සභා තීරණයකින් ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරීන් සංඛ්‍යාව 09 ක් දක්වා වැඩිකර තිබුණි. | අනුමත ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි තනතුරු සංඛ්‍යාව 04 සිට 09 දක්වා වැඩි කිරීමට 2K16.224.08(2) හා 2016.04.26 දිනැති කොමිෂන් සභා තීරණය මගින් අනුමැතිය ලබාදී ඇත. ඒඅනුව අංක 2K16.227.10(11) හා 2016.07.26 දිනැති කොමිෂන් සභා තීරණ ප්‍රකාරව මෙම නිලධාරීන් ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි තනතුරට උසස් කිරීමට කොමිෂන් සභා අනුමැතිය ලැබී ඇත. | අනුමත ප්‍රමාණය ඉක්මවා ඇති තනතුරු ප්‍රමාණය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

**3.7 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව සතුව පැවති වාහන 29 ක් අතුරින් වාහන 05 ක් 2018 වර්ෂය තුළ භාවිතා කර නොතිබුණ අතර මෙම වාහන අපහරණය කිරීම සඳහා 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. එසේ වුවද වෙන්දේසි කිරීම වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | 2019 වර්ෂය තුලදී එම වෙන්දේසි කිරීමේ කටයුතු අවසන් කිරීමට හැකි වන පරිදි මේ වන විට නව කමිටු පත්කර අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වාහන අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අපහරණය කළ යුතු වාහනවලින් වාහන 03 ක්ම සංඛ්‍යාත පිරික්සුම් රථ වූ බැවින් සංඛ්‍යාත පිරික්සුම් කටයුතු කරගෙන යාමට මෙය බාධාවක් වී පැවතුණි. | සංඛ්‍යාත පිරික්සුම් රථ 03 මගින් සංඛ්‍යාත පිරික්සුම් කටයුතු කිරීමේදී බාධාවක් වන බව අදාල කාර්මික අංශ මගින් දැනුම් දී ඇති අතර ධාවනය කල නොහැකි රථ මගින් තව දුරටත් පිරික්සුම් කටයුතු සිදු කිරීම නොකරන බැවින් නව රථය මගින් සංඛ්‍යාත පිරික්සුම් කටයුතු දැනට සිදු කරනු ලබයි. තවද නව රථ ලබා ගැනීමට මේ වන විට සිදු කරමින් පවතී. | නව රථ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ මානව සම්පත් කළමනාකරණය කිරීමේ පරිගණකගත වැඩසටහන, ගබඩා පාලනය සඳහා වූ පරිගණකගත වැඩසටහන සහ උසාවි නියෝග හා ලියවිලි ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන වර්ෂය තුළ ආරම්භ කර හෝ නොතිබුණි. | 2018 වසර අග භාගය වනතුරු ආයතනයේ තොරතුරු තාක්ෂණික ඒකකය නිසි පරිදි ස්ථාපනය කර නොතිබූ අතර, අදාල ප්‍රසම්පාදනයන් සිදුකිරීමේ අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ලබාගැනීමේ දුෂ්කරතාව නිසා අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදුකරගත නොහැකි වූ බව. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂය තුළදී සිදු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ කාර්යයන් 16 ක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණ අතර එහි ප්‍රගතිය සියයට 5 සිට සියයට 80 දක්වා විය. මේ තුළ සියයට 25 ක් හා ඊට අඩු ප්‍රගතියක් ලැබූ කාර්යයන් 03 ක් හා සියයට 50 ක් හා ඊට අඩු ප්‍රගතියක් ලැබූ කාර්යයන් 05 ක් විය. | අදාල කාර්යයන් පිළිබඳ ප්‍රගතිය ලබා නොගැනීම පිළිබඳව අදාල අංශ ප්‍රධානීන්ගේ විශේෂ අවධානයට ප්‍රගති සමාලෝචනයේදී යොමුකරවන ලදී. ඒ අනුව 2019 වසරේදී පසුගිය වසරේ ප්‍රගතිය ලබාගැනීමට නොහැකි වූ ක්‍රියාකාරකම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර කාර්යසාධනය ඉහල නැංවීම සඳහා පියවර ගැනීමට කටයුතු කරන බව. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාල සහාය කරගෙන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීමට පසුගිය වර්ෂයේදී සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ද ඒ සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදනයක් වෙන්කර ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වැයක් දරා නොතිබුණද, එහි ප්‍රගතිය සියයට 50 ක් බවට ආයතනය විසින් දන්වා තිබුණි. | විදුලි සංදේශ පර්යේෂණ සිදුකිරීමට අදාළ වන සියළු කටයුතු නිම කර මෙම ක්‍රියාකාරකමෙහි ප්‍රගතිය ලබා තිබූ අතර අදාළ ගිවිසුම් ප්‍රකාරව මූල්‍ය ප්‍රතිපාදන පර්යේෂණ සමාලෝචනයට පසුව මේ වසරේදී කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කර ඇත. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර සියයට 8 සිට සියයට 34 දක්වා වූ පරාසයක විචලනයන්ද, අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 33 සිට සියයට 96 දක්වා වූ පරාසයක විචලනයන්ද නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනයට ඇතුළත් නොකළ රු.20,397,633 ක් වටිනා වැය විෂයයන් 11 ක් ද විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | සටහන් කර ගතිමි. | අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී විචලනයන් හැකිතාක් අවම වන ආකාරයට පිළියෙල කළයුතු බව හා අයවැය ලේඛනය පාලන කාරකයක් වශයෙන් යොදා ගැනීමට කටයුතු කිරීම කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු පාදක කර ගනිමින් විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා 2030 වන විට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදේශ කටයුතු ආවරණය කිරීමේ ඉලක්කය කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංඛ්‍යාන ආවරණය කිරීමේ ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | මේ සම්බන්ධව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පුළුල් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘති "ගමට සංනිවේදනය" යන නමින් නම් කර ඇත.<br>සේවාදායක සමාගම් හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් ඉදිරියේදී එම ප්‍රදේශවල පවතින මෙම සංනිවේදන පරතරය අවම කිරීමට බලාපොරොත්තු වේ. | අවශ්‍ය සංඛ්‍යාන ආවරණය කිරීමේ ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගත යුතුය. |